27/06/2010 - ඉරිදා ලංකාදීප

**"බ්‍රෙඩ් ඇන්ඩ්" සර්කස් සංදර්ශනයෙන් එපිටට යායුතු අය-වැය - මිලින්ද මොරගොඩ**

කාපල්ලා, බීපල්ලා, ජොලි කරපල්ලා යන ලංකාවේ එන ව්‍යවහාරය එලෙසම පැවසීම දරුණු වැඩි ද යන්න මම නොදනිමි. එහෙත් මේ සංස්කෘතියේ එක් කෙළවරක් පැටලී ඇත්තේ පැරණි රෝම අධිරාජ්‍යයේ  පැවති පාලනය හා සමගය. අධිරාජ්‍යවාදී බලවත් පාලනයක් පැවති රෝමයේ එම පාලන ක්‍රමය බ්‍රෙඩ් ඇන්ඩ් සර්කස් (Bread and Circus) ප්‍රචලිතය. බඩගින්නට පාන්ය. හිත පිරෙන්නට සංදර්ශනය. කා බී සංදර්ශනයෙන් සැනසෙන ජනී ජනයාට වෙනත් දෙයක් ගැන හිතන්නට ඉඩක් නැත. රෝමයේ මෙම සංදර්ශන පවත්වන ලද්දේ රජු ඇතුළු පාලකයන් ද නරඹන්නන් වශයෙන් සහභාගී වන සටන් වශයෙනි. භයානක සතුන් සමගත්, සටන්කාමී මිනිසුන් අතරත් පවත්වන මරණයෙන් කෙළවරවන මෙම සටන් නැරඹීමෙන් සංතෘප්තියට පත්වන මිනිසුන්ට පාලනයේ වැරදි නොපෙනේ. පාලකයන්ට විරුද්ධව නොයයි. සියල්ල සතුටුදායක ලෙස පවත්වාගෙන යා හැකිවෙයි.

නිදහසින් පසු ලංකාවේ රාජ්‍ය පාලන අවතීර්ණය වූයේ මේ කා බී සන්දර්ශනයෙන් සැනසෙන සංස්කෘතියටය. මහ මැතිවරණ ආණ්ඩු බලයට පත් කරයි. මැතිවරණයේ දි ප්‍රධාන සටන් පාඨය බඩවියත පුරවන ආකාරය ගැනය. නොමිලේ හාල්, සහනාධාරක්‍රම ඒ අතර ප්‍රධානය. බඩු මිල වැඩිවන විට වීදිසටන් වලටත් පසුව ආණ්ඩු පෙරලන්නටත් ජනතා බලවේග පෙළගැසෙති. එවිට ආණ්ඩු අත්හදා බලන්නේ සංදර්ශන කලාවයි. රටපුරා සැනකෙළි පවත්වති. සහනාධාර මගින් බඩපුරවයි. එපමණක් නොවේ සංදර්ශන වලින් හිතත් පුරවයි. සිංගප්පූරුවේ අගමැති ලීක්වාන් යූ ලංකාවේ මේ දේශපාලනය හඳුනාගත්තේය. ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය කළින් කළට කෙරෙන නැති සම්පත් වෙන්දේසි කිරීමක් බව ඔහු ප්‍රකාශ කළේය.

මේ කලාවෙන් ආණ්ඩු දිගටම කරගෙන යන්නට ඉඩ නොලැබේ. ආදායම් උපයන වැඩ පිළිවෙලක් නැතිවනවිට ආර්ථිකය අවුල්වන්නට පටන්ගනී. බඩ කට පිරී හිත සන්තෝෂවීමෙන් පමණක් ප්‍රශ්න විසඳෙන්නේ නැත.  එකින් එක ගොඩ ගැහෙන මහජන ප්‍රශ්න පුපුරා පිටාරගලයි. එවිට විප්ලවීය චරිත බිහිවෙයි. ඔවුහු අප්‍රමාණ දුක් වේදනා පුරවාගෙන සිටින ජනතාව සිහිනයෙන් අවදිකරන්නට පටන් ගනී. මර්දනය ඇරඹෙන්නේ ඉන්පසුය. නිදහස ලබා ගතවූ දශක හයකට මදක් වැඩි කාලය තුළ ශ්‍රී ලංකාවේ ප්‍රධාන තරුණ අරගල තුනක් සිදුවිය. දකුණ අරගල දෙකකට පසුබිම සැකසිය. තුන්වැන්න මතුවූයේ ජාතිවාදී ස්වරූපයෙන් උතුරුකරයෙනි. මේ හැමඑකක්ම එකිනෙක පරයමින් ආණ්ඩුවට අභියෝගයක් විය. හැමවිටම කැරැල්ල මර්දනයට හමුදාව ගන්නා ක්‍රියාමාර්ග වලට මුහුණ දෙන්නට ඊළඟට මතුවෙන කැරැල්ල සන්නද්ධව ශක්තිමත්වීම කැපී පෙනෙයි. රතිඤ්ඤා කරල් හා ගල්කටස් තුවක්කුවලින් පටන්ගත් විප්ලව අවසන්ව ඇත්තේ මරාගෙන මැරෙන චරිත බිහිකරමිනි. ජනතාවගේ ප්‍රශ්න වලට සාධාරණ විසඳුම් වෙනුවට තවදුරටත්  කාපල්ලා, බීපල්ලා, ජොලි කරපල්ලා නැතිනම් ''බ්‍රෙඩ් ඇන්ඩ් සර්කස්'' විසඳුම් දෙන්නට ගියහොත් මීළඟ විප්ලවයේ ස්වරූපය කෙබඳුවිය හැකිද්‍රියි සිතාගැනීම පහසු නැත. එපමණක් නොවේ. මේ කැරලිකරුවන් ඉල්ලන්නේ පවතින පාලන ක්‍රමයට විකල්පයකි. පවතින ක්‍රමය දිගටම පවත්වාගෙන යන්නේ විප්ලවකාරී තරුණ පරපුරේ රුධිරයෙන් පෝෂණය වෙමිනි. උතුරේත් දකුණේත් මර්දනයට ගොදුරුවූයේ හා මර්දනය උදෙසා රජයේ හමුදාවට එකතු වූයේ ලංකාවේ දුප්පත් තරුණ පරම්පරාවයි. විකල්පය ඉල්ලන පරම්පරාව විනාශ කරමින් ක්‍රමය දිගටම පවත්වාගෙන යාමේ සම්ප්‍රදාය සාධාරණ ද? නිදහසින් පසු බලයට පත්වූ සියලුම ආණ්ඩු ප්‍රිය හෝ නොප්‍රිය ගොදුරු වූ ඉරණම මෙයයි. සමාජය සම්පූර්ණයෙන් විනාශවී හවුහරණක් නැතිවන්නට කළින් මෙම සම්ප්‍රදායෙන් ඉවත්විය යුතුව ඇත.

''බ්‍රෙඩ් ඇන්ඩ් සර්කස්'' මාවතින් ඉවත්ව අනන්‍යතාවයක් ඇති ගමනක් වෙනුවෙන් රටට ඉතිහාසය තුළ අවස්ථා ගණනාවක් ලැබිණ. නිදහස ලැබුණ වහාම එය කළහැකිව තිබුණි. ඒ වන විට පැවති ආර්ථික ප්‍රබෝධයෙන් සෑහීමකට පත්වීම හෙයින් දුරදකින වැඩපිළිවෙලක් ඇරඹුණේ නැත. 1977 වසරේ ආර්ථික ප්‍රතිපත්ති වෙනස්වීම සමග ප්‍රශ්න වලින් මිරිකීසිටි ජනතාව වෙනුවෙන් අලුත් ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙන්නට අවස්ථාවක් තිබිණ. තුන්වැනිව රට ආර්ථික වශයෙන් වැටී බරපතල ප්‍රශ්නවලට මුහුණ දී සිටි අවස්ථාවේ මෙරටට සුනාමි විපත ද පැමිණියේය. ඒ අවස්ථාවේ විශාල වශයෙන් ජාත්‍යන්තර ආධාර රටට ලැබිණ. සමාජයත් ආර්ථිකයත් අලුත් යුගයකට යොමු කරන්නට

ලැබුණු එම අවස්ථාව ද ප්‍රයෝජනයට ගත්තේ නැත. දශක තුනක් පැවති ත්‍රස්තවාදය අවසන් කිරීමෙන් පසු එළැඹ ඇති මේ මොහොත ඒ වෙනුවෙන් ප්‍රයෝජනයට ගත හැකි අගනා මොහොතකි. යුද්ධය වෙනුවෙන් එඩිතර නායකත්වයක් ද ජීවිත පූජාවෙන් රණබිමට ගිය හමුදාවක් ද රටට සිටියි. සමස්ථ සමාජයම ත්‍රස්තවාදය මැඩපැවැත්වීම උදෙසා විශාල කැපවීමක් කළේය. ඒ වෙනුවෙන් ඔවුන් විශාල ආත්ම ශක්තියකින් ක්‍රියාකළේය. මේ නිසා බිහිවී ඇති අලුත් සමාජය වෙනුවෙන් අලුත් දැක්මක් ඇතිව ක්‍රියාකරන්නට අවස්ථාව තිබේ. ත්‍රස්තවාදය වෙනුවෙන් එකතුවූ බලවේගය ආර්ථිකය නැංවීම සඳහා යොමු කළ යුතුය. එසේ නොවුනහොත් රට යළිත් ඇතුල් වන්නේ ''බ්‍රෙඩ් ඇන්ඩ් සර්කස්'' සංස්කෘතියටමය.

මේ වන විට 2010 වසරේ අයවැය ලේඛනය ඉදිරිපත් කරන්නට නියමිතය. මෙවර අයවැය තාවකාලික එකකි. වසරේ අඩක් ගතවී තිබේ. එපමණක් නොව ලබන වසරේ අයවැය යෝජනා තවත් මාස කිහිපයකින් පාර්ලිමේන්තුව හමුවට ඉදිරිපත් කළ යුතුය. බදු අයකරන, එම බදු සහනාධාර හැටියට බෙදන සහ යළිත් බඩපුරවා සන්දර්ශන වලින් ජනතාව සිහිනයක පටලවන මාර්ගයෙන් ඉවත්වීම අවශ්‍යය. 2010 අයවැය ලේඛනය රට ගොඩනගන දර්ශනයට පදනමක්වන බව පෙන්වීම අවශ්‍යය. අයවැය බදු අයකරන ලේඛනයක් නොවේ. රටක් ගමන් කරන දර්ශනය පෙන්වන දර්ශකයක් වියයුතුය. රටේ ගමන්මග හා ප්‍රතිපත්ති දෙස් විදෙස් ආයෝජකයන් හඳුනා ගන්නේ අයවැය ලේඛනය මගින් බව අමතක කළයුතු නැත.

ශ්‍රී ලංකාව සියයට දහයක වර්ධනයක් අවම වශයෙන් ඇති කරගත යුතුය. ෆ්‍රිනට පවතින සියයට පහක හයක වර්ධනය යන්තමින් ජීවනෝපාය පවත්වාගෙන යන්නට ප්‍රමාණවත්ය. එහෙත් නව ආයෝජන හෝ රැකියා අවස්ථා වැඩිකරගන්නට එය ප්‍රමාණවත් නොවේ. ආර්ථිකය වර්ධනය කරන්නට නම් බරපතල තීන්දු කිහිපයක් ගත යුතුය. ඒවා මිහිරි තීරණ විය නොහැකිය. ආදායමට සරිලන ලෙස වියදම ගලපා ගැනීම පළමු කාරණයයි. සීමාවකින් තොරව වියදම් කරමින් ආදායම අඩු වන විට බදු පනවනවිට එහි බර ෆ්‍රිනෙන්නේ මහජනතාවටයි. බදු වැඩිවන විට බදු නොගෙවන පිරිස වැඩි වෙයි. බදු වැඩි නිසා අලුත් කර්මාන්ත ව්‍යාපාර බිහිනොවන අතර කලු ආර්ථිකයක් ඇතිවෙයි. දෙවනුව ආර්ථිකයේ තරඟකාරීත්වය වැඩිකිරීම අවශ්‍යය. යුධ පරිසරයේ දී ඒ දෙස විනා ආර්ථිකයේ වෙනස්කම් ඇතිවිය යුතු අංශ කෙරෙහි අවධානය යොමු කළේ නැත. මේ නිසා තරඟකාරීත්වය හා කාර්යක්ෂමතාවය අඩුවීම හෙයින් මෙරට නිපැයුම් වල මිල හා තත්ත්වය පහතවැටී ඇත. එය ජාත්‍යන්තර වෙළඳාමේ දී ශ්‍රී ලංකාවේ වෙළඳාමට ගැටලු ඇති කරයි. කර්මාන්ත ව්‍යාපාර අරඹන්නට අවශ්‍ය කරන හිතකර පරිසරය තවමත් දුර්වලය. ව්‍යාපාර සඳහා අවසර ගැනීමට මාස ගණන් ගතවේ. තවත් සමහරවිට ආරක්ෂක, පරිසර, පලාත් හා සේවා ඇතුලු අංශ ගණනාවකින් විටින් විට අවසර ගන්නට විශාල කාලයත් ධනයත් වැය කරන්නට සිදුවෙයි. ව්‍යාපාර වලට මෙය හිරිහැරයකි. වෙනත් රටවල දිනකින් දෙකකින් නිකුත්කරන අවසර ගන්නට කල්ගතවීම නිසා ලාංකික සමාගම් පවා විදේශරටවලට ගොස් තම මුදල් ආයෝජනය කරන අවස්ථා ඇත. ශ්‍රී ලංකාව අපනයන වෙළඳාමේ දී තරඟකරන රටවලට වඩා කාර්යක්ෂමතාවයක් හා ප්‍රමිතියක් තබා ගැනීම වැදගත්ය. කාන්තාරයක් ව තිබුණු ඩුබායි දේශය සංවර්ධනය වන විට එහි ප්‍රමිති සකස්වුයේ ඒ වන විට දියුණු වී තිබූ සිංගප්පූරුවට අභියෝගයක් වන අන්දමටය. නිර්භය තීරණ ගත්තේය. ඒවා ජනප්‍රිය තීන්දු නොවූ අතර එම තීන්දු ගන්නා විට මතුවූ බලවේග ඉදිරියේ සලිතවූයේ නැත. ශ්‍රී ලංකාව සූදානම් විය යුත්තේ ආසියාවේ සෙසු තරගකාරී රටවලට වඩා ඉදිරියෙන් සිටින්නටය. මේ අනුව අයවැය සකස් කළ යුතු වන්නේ මෙකී අරමුණු දිනා ගැනීමට විනා ලැබෙන ආදායමට අනුව වියදම සකස් කිරීමේ පටු පරමාර්ථයෙන් නොවන බව ඉතාමත් පැහැදිලිය. නීති රීති වෙනස් කළ යුතුය. පරිපාලනය හා තීන්දු ගැනීම් අදට ගැලපෙන පරිදි සකස් විය යුතුය.

එනමුත් ''බ්‍රෙඩ් ඇන්ඩ් සර්කස්'' සංස්කෘතියට හුරු වී සිටින ලාංකිකයන් මෙම වෙනස්කම් සිදුවන විට එයට විරුද්ධ වන බවට සැකයක් නැත. පවතින ක්‍රමය වෙනස් කිරීමට ඒ ක්‍රමයෙන් යැපෙන කිසිවෙකු කැමති නැත. ක්‍රමය වෙනස් කිරීමෙන් විශාල අවාසියක් වන බවට භීතියක් පතුරවන අතර ඒ හරහා විරෝධතා හා උද්ඝෝෂණ ඇති කරයි. ක්‍රමය වෙනස් කිරීමෙන් ක්‍රමයෙන් වාසි නොලබන එහි අවාසිම දරා සිටින දුප්පත් මහජනතාවට එයින් පහලට වැටෙන්නට තවත් ප්‍රපාතයක් තිබිය හැකිද? නැත. මේ

නිසා මහජනතාව නිතරම මෙවැනි මත පතුරවන විට අවාසිය සිදුවන්නේ තමන්ටද? නැතිනම් ක්‍රමයෙන් යැපෙන කණ්ඩායමට ද? යන්න සොයා බලන්නට පෙළැඹීම වටී.

ආර්ථිකය ප්‍රතිසංස්කරණයවී, නව ආයෝජන බිහිවීමෙන් පසු විශාල වෙළඳපොලක් කරා නිශ්පාදන හා සේවා අලෙවි කරන්නට සූදානම් වන විට සීපා වැනි ගිවිසුම් වල වටිනාකම ලැබෙන්නේ. එහි ඇත්තේ මිලියන විස්සක පමණ ශ්‍රී ලංකාවට පමණක් නොව ඉන්දියාවත් වෙළඳපොළක් බවට පත්කරන අවස්ථාවකි. අනාගතයේ දී ලෝක වෙළඳ සංවිධානයේ රාමුව අනුව මුලුලෝකයම වාරණයෙන්තොර වෙළඳපොළක් බවට පත්වනවිට ආනයන හා අපනයන අතර පවතින බැදීම් ලිහිල් වෙයි. ලංකාවට එකවරම එයට මුහුණ දෙනවාට වඩා ඉන්දියාව සමග ආර්ථික ගිවිසුමක අත්දැකීම් සමග ප්‍රවේශ වීමට හැකිනම් ප්‍රයෝජනවත්ය. රටවල් ගණනාවක් ඉන්දියාව සමග ගිවිසුම් අත්සන් කරන්නට ඉතා කැමැත්තෙන් පසුවන අවස්ථාවක ලංකාව මෙම ගිවිසුමට යා යුත්තේ ආත්ම විශ්වාසයක් ඇතිවය.

අයවැය මගින් ආර්ථිකයේ ඇති බැඳීම් හා පැරණි ආකල්ප ලිහිල් කළයුතු සේ ම රාජ්‍ය සේවය, අධ්‍යාපනය හා කෘෂිකර්මය වැනි පැති කෙරෙහි ද මෙයට වඩා පුලුල්ව තීන්දු ගත යුතුව තිබේ. රටක් දියුණුවන විට කළමණාකරණයට දක්ෂ, අධ්‍යාපනයක් ඇති මානව සම්පත අත්‍යවශ්‍ය සාධකයකි. දැනට පවතින අධ්‍යාපන ක්‍රමයෙන් බිහිකරන්නේ තීරණ ගතහැකි කළමණාකරුවන් නොවේ. අධ්‍යාපනය අවසන්කරන බහුතරය අපේක්ෂා කරන්නේ රජයේ රැකියාවකි. රජය රැකියා සපයන්නෙක් විය යුතු නැත. වර්තමාන අධ්‍යාපන ක්‍රමය ව්‍යාපාරිකයන් හා නව නිපැයුම්කරුවන් බිහිකරන්නේ නැත. පාසලෙන් එළියට එන්නේ තවත් කෙනෙකු යටතේ රැකියා කරන ආකල්ප ඇති පුද්ගලයෙකි. මෙම වහල් ආකල්ප වලින් රට දියුණු නොවේ. මේ ආකල්ප වෙනස් කළයුතු පාසල් අවධියේ පටන්මය.

රජයේ සේවකයන්ගේ වැටුප් ගෙවන්නේ මහා භාණ්ඩාගාරයට මහජනතාවගෙන් බදු වශයෙන් එකතුවන මුදලින්ය. රජයේ සේවකයන් වැඩි වන විට මහජනතාවගෙන් වැඩි වැඩියෙන් බදු අයකරන්නට සිදුවෙයි. අධ්‍යාපන ක්‍රමය තරගකාරීව වෙනස් වී, රටට අවශ්‍ය කළමණාකරුවන් බිහිකරන්නට නම් එයට පෞද්ගලික අංශයේ දායකත්වය ලබා ගත යුතුය. අධ්‍යාපනය පමණක් නොව පෞද්ගලික අංශය දක්ෂ ලෙස කරන්නට සමත් ව්‍යාපාර ඔවුන්ට තරගකාරීව කරන්නට අවස්ථාවදීම වටී. ආණ්ඩු කළයුත්තේ හැම දේම තමන්ම කරන්නට යාම නොව පරිපාලනය හා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීමයි. නීති රීති හා ප්‍රමිතීන් සකස් කර ඒ රාමුවට අනුකූලව මෙහෙයවෙන පෞද්ගලික අංශයේ ව්‍යාපාර රජයට බරක් වන්නේ නැත. දැන් රජයේ සියලු ආයතන මහජනතාවට සේවයක් බව දක්වමින් පාඩු ලබන අතර ඒවා නඩත්තුවන්නේ මහජනතාවගේ බදු ආදායමෙන්ය. මේ මගින් රටට අත්වන විශාල අවාසිය ආර්ථිකය අනතුරකට පත්කර තිබේ. අධ්‍යාපනය ක්‍රමවත්ව පුලුල් වන විට එහි අවස්ථා ජනතාවට ලැබේ. වියට්නාම හා ඉරාක යුද්ධ අවසන් ව ආපසු ඇමරිකාවට පැමිණි එරට හමුදාවේ ඉහල තනතුරුවල පිරිස් උපාධි හදාරා කම්හල්වල තීරණ ගන්නා තනතුරු වලට පත්වූහ. ලංකාවේ ත්‍රිවිධ හමුදාවේ, පොලිසියේ හා සිවිල් ආරක්ෂක අංශවල සිටින පිරිස ලක්ෂ හතරකට වැඩිය. යුද්ධයට අවශ්‍ය වූ මෙම සේනාංක සාමයට අවශ්‍ය වන්නේ සංවර්ධනයට දායක කර ගැනීමෙනි. ඔවුන්ට ක්‍රමයෙන් හොඳ අධ්‍යාපනයක් ලබා දීමෙන් විනය ගරුක කළමණාකරුවන් බිහිකර ගත හැකි වනු ඇත. එය සියයට දහයක ආර්ථික වර්ධනයක් කරා යන රටකට අවශ්‍ය මානව සම්පත බිහි කිරීමකි.

මෙම ආර්ථික වර්ධනය ඇති කරගන්නට නම් මුදල් අවශ්‍යය. ආණ්ඩුවට බදු වැඩි නොකර අරමුදල් සම්පාදනයට ඇත්තේ ආයෝජන දිරිමත් කිරීම හා ණය ගැනීම පමණකි. ඩුබායි වරාය අලුතින් ඉදිවන විට ඔවුන් ක්වෙට් රටින් හා ඩුබායි හි ප්‍රධාන ව්‍යාපාරිකයන්ගෙන් ණය ලබාගත්තේය. මේ මුදල් නිසි ලෙස ආයෝජනය කිරීමෙන් එහි සම්පූර්ණ වාසිය හිමිකරගත්තේය. ණය ගැනීම අයහපත් නැති නමුත් එහි සීමාව ඉක්මවා යාම ආර්ථිකය අනතුරකට පත්කරයි. ශ්‍රී ලංකාව ලැබෙන් ක්‍රමයෙන් ණය ගැනීමේ අනතුරුදායක සීමාව කරා ලඟාවෙමින් සිටී. මේ අවස්ථාවේ දී රාජ්‍ය පෞද්ගලික හවුල්කාර ව්‍යාපාර සංකල්පයට යාහැකිය. එය ලෝකයේ රටවල් ගණනාවක් ආණ්ඩුවේ විශ්වාසය හා පෞද්ගලික අංශයේ කළමණාකරණ දක්ෂතාවය ප්‍රයෝජනයට ගෙන ආර්ථිකය නංවන සංකල්පයකි. එහි පළමු අවස්ථාව වශයෙන් ලැබෙනට මෙරට සාර්ථක ව්‍යාපාරිකයන් රජයේ ආයතනවල ප්‍රධාන තනතුරු භාරගැනීම යහපත් ප්‍රවේශයකි. එහි ඇත්තේ දක්ෂතාවයෙන් ප්‍රයෝජන ගැනීමයි. අවශ්‍ය පහසුකම් දී

ඔවුන්ගේ ආකල්ප අනුව ව්‍යාපාර මෙහෙයවන පරිසරය වෙනස් කළහොත් ආණ්ඩුවේ ව්‍යාපාර මෙහෙයවීමේ හැකියාව විප්ලවීය මාවතකට ප්‍රවේශවනු නොඅනුමානය.

කෘෂිකර්මය ද ලාභ ලබන තත්ත්වයට පත්කළ යුතුය. ලංකාවේ වී ගොවිතැන ඉතිහාසයක් ඇති වටිනා සංස්කෘතික දායාදයකි. නමුත් එහි නියැලි පිරිස ක්‍රමයෙන් එයින් ඈක්වන බව පෙනේ. වී ගොවිතැන පවත්වාගෙන යන්නේ විශාල වශයෙන් සහනාධාර සපයමිනි. අපරට හා සමානව වී ගොවිතැන සංස්කෘතියක සිටින චීනය, ජපානය හා තායිලන්තය වැනි රටවල් ද මේ අභියෝගයට මුහුණ දී තිබේ. ෆ්‍රින් එම රටවල් නවීන ලාභදායී වී ගොවිතැන කරන අතර සම්ප්‍රදාය ද ආරක්ෂා කරගෙන ඇත. එය සිදු කරන ලද්දේ මහා පරිමාන වානිජ කෘෂිකර්මය දිරිගන්වන අතර විශ්ව විද්‍යාල අධ්‍යාපනයෙන් පසු වුවත් ගොවිපොලට යාමෙන් ජීවිතය ජයගතහැකි බව පෙන්වා එයට අනුබලදීමෙන්ය. ජාත්‍යන්තර සමීක්ෂණ අනුව අනාගතයේ දී මහපොලව මත ආහාර හා ජලය හිඟවනු ඇත. එම යුගයට සූදානම් වන්නට තරම් සම්පත් ලංකාවට තිබේ. අධිරාජ්‍යවාදීන් විසින් හුරුකළ තේ හා රබර් වැනි ප්‍රධාන ආර්ථික භෝග වලට වඩා වෙනස් යුගයකට ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය යොමු කළ හැකිය. එය කළ හැක්කේ ප්‍රතිපත්ති වෙනසක් ඇති කිරීමෙනි. කෘෂිකර්මයට සම්බන්ධ ධීවර ක්ෂේත්‍රය ද සුළුපන්න ක්‍රමයට සීමාවී තිබේ. විදේශීක යාත්‍රා මෙරට මුහුදු සීමාවට පැමිණ බලයා වැනි මසුන් අල්ලා සකස් කර මෙරටටම එවන තත්ත්වයක් අද තිබේ.

මේ සියල්ල වෙනස් කිරීම අවශ්‍යය. ආකල්ප වෙනසක් ඇති කළයුතුය. ප්‍රතිසංස්කරණ ඇති කිරීමෙන් විනා සමාජයේ ඉදිරි ගමනක් ඇති නොවේ. සියයට පහක හෝ හයක වර්ධන වේගයක් පවත්වාගෙනයමින්  කාපල්ලා, බීපල්ලා, ජොලි කරපල්ලා යන සංකල්පයෙන් පවතින්නට තවදුරටත් සූදානම් විය යුතු නැත. එසේ පැවතීමෙන් ක්‍රමය ආරක්ෂාවන හා ඒ නිසා යැපෙන පිරිස මෙයට විරුද්ධ වන බව නිසැකය. ක්‍රමය වෙනස්වීම නිසා නිතරම අවදානමට මුහුණ දෙන්නේ එයින් යැපෙන පිරිසයි. එහෙත් මේ සම්ප්‍රදායික බ්‍රෙඩ් ඇන්ඩ් සර්කස් (Bread and Circus) රටාව අයවැය ලේඛනය හරහා සම්පූර්ණයෙන් වෙනස් කළ හැකිය. එය අලුත් පරිවර්තිත සමාජයක ආරම්භය වෙයි. නමුත් සමාජ බලවේග වලට මුහුණ දෙමින් මෙම පරිවර්තනය කර යාමට නම් විශාල ආත්ම ශක්තියක් හා ධෛර්යයක් තිබිය යුතුය. තිස් වසරක භයානක යුද්ධයකට මුහුණ දුන් සමාජයක් සතුව එම වටිනාකම් ඇති බව නිසැකය. අවශ්‍ය වන්නේ නිසි තීන්දු නිසි අවස්ථාවේ දී ගැනීමයි.